අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/17/03/01/01/01
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2026.01. 02

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම පරිවේණාධිපති හිමිවරුන්
සියලු ම රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත

**නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ 2026 වසර සඳහා පාසල් කාලසටහන සංශෝධනය කිරීම සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය උපයෝජනය කිරීම පිළිබඳ උපදෙස් සංග්‍රහය**

මේ වන විට ඔබ වෙත යොමු කර ඇති චක්‍රලේඛ සහ උපදෙස් ලිපි මඟින් පාසල්වල 5 ශ්‍රේණිය සහ 6-13 ශ්‍රේණි සඳහා 2026 වර්ෂයේ නව පාසල් වාරය ආරම්භයේ සිට දෛනික ව පාසල් අවසන් කළ යුතු වේලාව ප.ව. 2.00 ලෙස දක්වා තිබුණ ද, රට තුළ පසුගිය දිනවල උද්ගත වූ ස්වභාවික ආපදා තත්ත්වය මත විශේෂයෙන් ම පළාත් කිහිපයක පාසල් පද්ධතියට මෙන් ම ප්‍රවාහන පද්ධතියට සිදු වූ දැඩි අලාභහානි හේතුවෙන්, පාසල් වේලාව දීර්ඝ කිරීම මඟින් එම පළාත්වල පාසල් දරුවන්ට හා අනෙකුත් පාර්ශවයන්ට අපහසුතා රැසක් මතු විය හැකි බව නිරීක්ෂණය වේ. ඒ අනුව පාසල් පැවැත්වීමේ වේලාව දීර්ඝ කිරීමේ තීරණය 2026 වර්ෂය තුළ දී ක්‍රියාත්මක කරනු නොලැබේ.

2. 2026 වර්ෂයේ සිට හඳුන්වාදීමට අපේක්ෂිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට සමගාමී ව පාසල්වල 6-13 ශ්‍රේණි සඳහා පාසල් කාලසටහන සකස් කිරීම සම්බන්ධයෙන් 2025.11.04 දිනැති ව නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 34/2025 සහ අංක ED/16/01/05/10/- II වෙළුම හා 2025.11.04 දිනැති 'නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට සමගාමී ව ප්‍රාථමික අධ්‍යාපන අංශයේ පාසල් කාලසටහන සකස් කිරීමේ උපදෙස් ලිපිය' සහ 'මුස්ලිම් පාසල්වල 6-13 ශ්‍රේණි සඳහා කාලසටහන සකස් කිරීම' මැයෙන් යොමු කර ඇති අංක ED/09/55/02/11 හා 2025.12.16 දිනැති උපදෙස් ලිපිය, 'වැඩිදුර අධ්‍යයන මොඩියුල හා පරිවර්තනීය කුසලතා පිළිබඳ උපදෙස් සංග්‍රහය' මැයෙන් යොමු කර ඇති අංක ED/17/03/01/01/01 හා 2025.12.15 දිනැති ලිපිය හා 'පාසලක සිටිය යුතු අධ්‍යයන කර්යමණ්ඩලය නිර්ණය කිරීම' සඳහා වන 2021.04.28 දිනැති චක්‍රලේඛ අංක 6/2021 හා 2024.09.06 දිනැති චක්‍රලේඛ අංක 6/2021 (i) යන චක්‍රලේඛ වලට අමතර වශයෙන් මෙම උපදෙස් සංග්‍රහය නිකුත් කරනු ලැබේ. ඒ අනුව 2026 වසර තුළ දී පාසල් පැවැත්වෙන වේලාව දැනට **ක්‍රියාත්මක වන පරිදි ම පෙ.ව. 7.30 සිට ප.ව 1.30 දක්වා පැවැත්වීමට තීරණය කර ඇත.** මින් පෙර ලබා දුන් උපදෙස් පරිදි, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය 2026 වර්ෂයේ සිට 1 සහ 6 ශ්‍රේණි සඳහා ක්‍රියාත්මක කළ යුතු වේ.

3. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පාසල් ආරම්භ කිරීම

පළමු වන (1) සහ 6 වන ශ්‍රේණි හැර පාසල් වල අනෙකුත් ශ්‍රේණි සඳහා පළමු වාරය 2026 ජනවාරි මස 05 වන දින ආරම්භ වේ. 6 වන ශ්‍රේණියේ පළමු වාරය සඳහා පාසල් ආරම්භ කරන දිනය 2026 ජනවාරි මස 21 වේ. (එසේ වුවද ශිෂ්‍යත්ව ප්‍රතිඵල මත 6 වන ශ්‍රේණියට වෙනත් පාසල්වල සිසුන් ඇතුළත් කිරීමේ පරිපාලන කටයුතු 2026 ජනවාරි මස 05 දිනෙන් ඇරඹෙන සතිය තුළ සිදු කර ගත හැකි ය)

පළමු ශ්‍රේණිය (1) සඳහා පාසල් ආරම්භ කිරීම සම්බන්ධ ව මීට පෙර නිකුත් කර ඇති අංක ED/16/01/05/01/ හා 2025.12.16 දිනැති ලිපිය මඟින් දන්වා ඇති උපදෙස් එලෙස ම ක්‍රියාත්මක කළ යුතු ය. ඒ අනුව පළමු ශ්‍රේණිය සඳහා (1) දරුවන් හඳුනාගැනීමේ ක්‍රියාවලිය 2026 ජනවාරි මස 05 වන දින ආරම්භ කෙරෙන අතර විධිමත් ලෙස පළමු ශ්‍රේණියේ අධ්‍යයන කටයුතු ආරම්භය 2026 ජනවාරි මස 29 වන දින සිදු කෙරේ.

4. පාසල් කාලය හා කාලච්ඡේද සංඛ්‍යාව

4.1 සිංහල හා දෙමළ මාධ්‍ය පාසල්වල අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සෘජු ව ක්‍රියාත්මක වන 1 සහ 6 ශ්‍රේණි සඳහා මෙන් ම සෙසු ශ්‍රේණි සඳහා ද, අදාළ කාලසටහන් සම්බන්ධයෙන් පහත සඳහන් උපදෙස් අනුගමනය කළ යුතු වේ. මුස්ලිම් පාසල් සඳහා කාලසටහන් සකස් කිරීමේ උපදෙස් මෙම ලිපියේ අංක 6 යටතේ දක්වා ඇත.

4.2 ප්‍රාථමික අධ්‍යාපන අංශයේ 1- 4 දක්වා ශ්‍රේණි සඳහා කාලසටහන, මගේ අංක ED/16/01/05/10-II වෙළුම හා 2025.11.04 දිනැති 'නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට සමගාමී ව ප්‍රාථමික අධ්‍යාපන අංශයේ පාසල් කාලසටහන සකස් කිරීමේ උපදෙස් ලිපිය' යන්නෙහි සඳහන් පරිදි ම ක්‍රියාත්මක කළ යුතු වේ.

4.3 5 ශ්‍රේණියේ පාසල් පවත්වන වේලාව පෙ.ව. 7.30 - ප.ව. 1.30 ලෙස සංශෝධනය වන බැවින්, ඊට අදාළ සංශෝධිත කාලසටහන මෙම උපදෙස් ලිපියේ 5.1 හි දැක්වෙන පරිදී සිංහල හා දෙමළ මාධ්‍ය පාසල් සඳහාත්, එම ඉගෙනුම් ක්ෂේත්‍ර ආවරණය වන ලෙස අංක 06 හි දැක්වෙන පරිදි මුස්ලිම් පාසල් සඳහාත් ක්‍රියාත්මක කළ යුතු වේ.

4.4 අදාළ චක්‍රලේඛයෙන් ලබා දෙන ලද උපදෙස් පරිදි ම, 6-13 ශ්‍රේණි සඳහා දිනකට කාලච්ඡේද 7ක් ක්‍රියාත්මක වන අතර එහි දී එක් කාලච්ඡේදයක් සඳහා මිනිත්තු 45ක කාලයක් වෙන් කළ යුතු වේ. (මෙය 6-13 සියලු ශ්‍රේණි සඳහා අදාළ වන අතර, දැනට සකස් කර ඇති කාලසටහන්වල කාලය පමණක් මේ අනුව සංශෝධනය කරගත යුතු ය.)

4.5 පාසල්වල 6-13 ශ්‍රේණි සඳහා පාසල් කාලසටහන සකස් කිරීම පිළිබඳ උපදෙස් ඇතුළත් 2025.11.04 දිනැති අංක 34/2025 දරන චක්‍රලේඛයේ අංක 3.3 සහ 3.4 හි සෞන්දර්ය විෂයයන් සම්බන්ධව උපදෙස් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

6 ශ්‍රේණිය සඳහා නව විෂයමාලා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම

- සෞන්දර්ය විෂයයන් යටතට අයත් වනුයේ අංක 6.1.2.2හි සඳහන් විෂයයන් ය.

  මේ යටතේ අංක 8හි සඳහන් සාහිත්‍ය රසාස්වාදය (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි/ අරාබි) 6 ශ්‍රේණිය සඳහා අදාළ නොවේ.

**කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණි සඳහා පැරණි විෂයමාලාව ක්‍රියාත්මක කිරීම**

- සෞන්දර්ය විෂයයන් යටතට අයත් වනුයේ අංක 6.1.2.2. හි සඳහන් විෂයයන් ය.

  මේ යටතේ අංක 8 හි සඳහන් සාහිත්‍ය රසාස්වාදය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි/අරාබි) 7-9 ශ්‍රේණි සඳහා අදාළ නොවේ.

4.6 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව මොඩියුලපාදක ඉගෙනුම් ක්‍රියාවලිය තුළින් අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කර ගැනීම සඳහා සැලසුම් කර ඇති පරිදි ම 6 ශ්‍රේණියේ සිසුන් විසින් වර්ෂයක දී අත්පත් කර ගත යුතු මුළු සම්භාර (Credits) ප්‍රමාණයේ (සම්භාර 105) හා සම්භාරයක් සඳහා සිසු ඉගෙනුම් කාලයේ (මිනිත්තු 600) කිසිදු වෙනසක් සිදු නොවේ.

4.7 මෙම ක්‍රමවේදය 2026 වසර සඳහා ක්‍රියාත්මක කිරීමේ දී, දැනට පැරණි විෂය නිර්දේශය ක්‍රියාත්මක වන 7-11 ශ්‍රේණිවල එක් එක් විෂයය සඳහා වෙන් වන සමස්ත කාලයේ යම් අඩුවීමක් සිදුවන බැවින්, එම කාලය ආවරණය කර ගැනීම සහ 6 ශ්‍රේණියේ මොඩියුල සඳහා අවශ්‍ය කාලය ආවරණය කර ගැනීම සඳහා, පළමුවන වාර විභාගය නොපවත්වා එම කාල සීමාව ද අධ්‍යයන කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතු ය.

5. සිංහල හා දෙමළ මාධ්‍ය පාසල්වල කාලසටහන් සකස් කරගත යුතු අකාරය :-

5.1 5 වන ශ්‍රේණිය සඳහා :-

| ඉගෙනුම් ක්ෂේත්‍ර | සතියකට වෙන්වන කාලය |
|---|---|
| මව්බස | පැය 5 |
| ගණිතය | පැය 5 |
| පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 7 මිනිත්තු 30 |
| ඉංග්‍රීසි | පැය 3 මිනිත්තු 05 |
| දෙවන ජාතික භාෂාව | පැය 1 |
| ආගම | පැය 2 |
| උදෑසන රැස්වීම හා ආගමික වතාවත් | පැය 1 මිනිත්තු 15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| විවේකය | පැය 2 මිනිත්තු 05 (දිනකට මිනිත්තු 25 - පාසල් ආහාර වැඩසටහන සඳහා පෙ.ව. 7.30 - පෙ.ව. 8.30 අතර මිනිත්තු 15ක් සහ විවේක කාලය සඳහා මිනිත්තු 10ක් බැගින්) |
| ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය 2 මිනිත්තු 05 (දිනකට මිනිත්තු 25 බැගින්) |
| විෂය සමගාමී ක්‍රියාකාරකම් | මිනිත්තු 30 |
| වෛකල්පික ක්‍රියාකාරකම් | මිනිත්තු 30 |
| **සතියකට මුළු කාලය** | **පැය 30** |

5.2 6-13 ශ්‍රේණි සඳහා :-

| වේලාව | කාර්යය/ කාලච්ඡේදය |
|---|---|
| පෙ.ව. 7.30- පෙ.ව. 7.45 | ආගමික වතාවත් සිදු කිරීම / උදෑසන රැස්වීම |
| පෙ.ව. 7.45- පෙ.ව. 8.30 | පළමු කාලච්ඡේදය |
| පෙ.ව. 8.30- පෙ.ව. 8.35 | නාමලේඛනය ලකුණු කිරීම |
| පෙ.ව. 8.35- පෙ.ව. 9.20 | දෙවන කාලච්ඡේදය |
| පෙ.ව. 9.20- පෙ.ව. 10.05 | තෙවන කාලච්ඡේදය |
| පෙ.ව. 10.05- පෙ.ව. 10.30 | විවේක කාලය |
| පෙ.ව. 10.30- පෙ.ව. 11.15 | හතරවන කාලච්ඡේදය |
| පෙ.ව. 11.15- ප.ව. 12.00 | පස්වන කාලච්ඡේදය |
| ප.ව. 12.00- ප.ව. 12.45 | හයවන කාලච්ඡේදය |
| ප.ව. 12.45- ප.ව. 1.30 | හත්වන කාලච්ඡේදය |

6. **මුස්ලිම් පාසල්වල 5-13 ශ්‍රේණි සඳහා කාලසටහන් සකස් කරගත යුතු අකාරය :-**

6.1 මුස්ලිම් පාසල්වල කාල සටහන සකස් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් උපදෙස් අනුගමනය කළ යුතු වේ.

6.1.1 එක් කාලච්ඡේදයක් සඳහා මිනිත්තු 45ක කාලයක් වෙන් කිරීම.

6.1.2 සඳුදා සිට සිකුරාදා දක්වා පාසල් ආරම්භ වන වේලාව පෙ.ව. 7.30 වන අතර, සඳුදා දින පමණක් කාලච්ඡේද 7ක් ක්‍රියාත්මක කරමින් ප.ව. 1.30 ට පාසල් කටයුතු අවසන් කිරීම.

6.1.3 අඟහරුවාදා සිට බ්‍රහස්පතින්දා දින දක්වා වන දින 03 හි දිනකට කාලච්ඡේද 8 බැගින් ක්‍රියාත්මක කරමින්, පාසල් කටයුතු ප.ව. 2.15ට අවසන් කිරීම. (ආගමික වතාවත් සිදු කිරීම සඳහා ප.ව. 12.30 සිට ප.ව 12.45 දක්වා කාලසටහනේ වේලාව වෙන් කර ඇත. මෙම වේලාව ප්‍රාදේශීය වශයෙන් පවත්වන කාලවේලා තත්ත්වයන් අනුව, නම්‍යශීලී ලෙස යොදා ගත හැකි ය.)

6.1.4 ඉස්ලාම් භක්තිකයන්ට සිකුරාදා දින ස්වකීය ආගමික වතාවත් ඉටු කිරීම සඳහා පල්ලියට යාමට සිකුරාදා දින පමණක් කාලච්ඡේද 4ක් ක්‍රියාත්මක කිරීමෙන් පසු පෙ.ව. 11.15ට පාසල් කටයුතු අවසන් කිරීම.

6.2 කාලසටහන ක්‍රියාත්මක වන අයුරු :-

6.2.1 මුස්ලිම් පාසල්වල සඳුදා දින කාලසටහන

| වේලාව | කාර්යය/ කාලච්ඡේදය |
|---|---|
| පෙ.ව.7.30 - පෙ.ව.7.45 | උදෑසන රැස්වීම සහ ආගමික වතාවත් සිදු කිරීම |
| පෙ.ව.7.45 - පෙ.ව.8.30 | පළමු කාලච්ඡේදය |
| පෙ.ව.8.30 - පෙ.ව.8.35 | නාමලේඛන ලකුණු කිරීම |
| පෙ.ව.8.35 - පෙ.ව.9.20 | දෙවන කාලච්ඡේදය |
| පෙ.ව.9.20 - පෙ.ව.10.05 | තෙවන කාලච්ඡේදය |
| පෙ.ව.10.05 - පෙ.ව.10.30 | විවේක කාලය |
| පෙ.ව.10.30 - පෙ.ව.11.15 | සිව්වන කාලච්ඡේදය |
| පෙ.ව.11.15 - ප.ව. 12.00 | පස්වන කාලච්ඡේදය |
| ප.ව.12.00 - ප.ව.12.45 | හයවන කාලච්ඡේදය |
| ප.ව.12.45 - ප.ව.1.30 | හත්වන කාලච්ඡේදය |

6.2.2 මුස්ලිම් පාසල්වල අඟහරුවාදා සිට බ්‍රහස්පතින්දා දින දක්වා කාලසටහන

| වේලාව | කාර්යය/ කාලච්ඡේදය |
|---|---|
| පෙ.ව.7.30 - පෙ.ව.8.15 | පළමු කාලච්ඡේදය |
| පෙ.ව. 8.15 - පෙ.ව.8.20 | නාමලේඛනය ලකුණු කිරීම |
| පෙ.ව.8.20 - පෙ.ව.9.05 | දෙවන කාලච්ඡේදය |
| පෙ.ව.9.05 - පෙ.ව.9.50 | තෙවන කාලච්ඡේදය |
| පෙ.ව.9.50 - පෙ.ව.10.35 | සිව්වන කාලච්ඡේදය |
| පෙ.ව. 10.35 - පෙ.ව.11.00 | විවේක කාලය |
| පෙ.ව. 11.00 - පෙ.ව.11.45 | පස්වන කාලච්ඡේදය |
| පෙ.ව. 11.45 - ප.ව. 12.30 | හයවන කාලච්ඡේදය |
| ප.ව.12.30 - ප.ව.12.45 | ආගමික වතාවත් සිදු කිරීම |
| ප.ව.12.45 - ප.ව. 1.30 | හත්වන කාලච්ඡේදය |
| ප.ව.1.30 - ප.ව. 2.15 | අටවන කාලච්ඡේදය |

6.2.3 මුස්ලිම් පාසල්වල සිකුරාදා දින කාලසටහන

| වේලාව | කාර්යය/ කාලච්ඡේදය |
|---|---|
| පෙ.ව.7.30 - පෙ.ව.7.45 | උදෑසන රැස්වීම සහ ආගමික වතාවත් සිදු කිරීම |
| පෙ.ව. 7.45 - පෙ.ව.8.30 | පළමු කාලච්ඡේදය |
| පෙ.ව.8.30 - පෙ.ව.8.35 | නාමලේඛනය ලකුණු කිරීම |
| පෙ.ව.8.35 - පෙ.ව.9.20 | දෙවන කාලඡේදය |
| පෙ.ව.9.20 - පෙ.ව.9.45 | විවේක කාලය |
| පෙ.ව.9.45 - පෙ.ව.10.30 | තෙවන කාලච්ඡේදය |
| පෙ.ව. 10.30 - පෙ.ව.11.15 | සිව්වන කාලච්ඡේදය |

7. වැඩිදුර අධ්‍යයන මොඩියුල

7.1 2026 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අදාළ වැඩිදුර අධ්‍යයන මොඩියුල හා පරිවර්තනීය කුසලතා මොඩියුල පිළිබඳ උපදෙස් සංග්‍රහය මැයෙන් අංක ED/17/03/01/01/01 හා 2025.12.15 දිනැති ව නිකුත් වූ උපදෙස් සංග්‍රහයෙන් වැඩිදුර අධ්‍යයන මොඩියුල තෝරා ගැනීමට අදාළ II කොටසේ 2026 වර්ෂයේ පළමු වන වාරය සඳහා හඳුන්වා දෙනු ලබන විෂයයන්ට අදාළ වැඩිදුර අධ්‍යයන මොඩියුල පිළිබඳ වගුවෙහි අනුඅංක 4 පහත පරිදි සංශෝධනය වේ.

| විෂයය | මොඩියුලයේ නම | වාරය | මාධ්‍යය | | |
|---|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| මව්බස (සිංහල /දෙමළ) | සාහිත්‍ය රසාස්වාදය | I | √ | √ | - |
| ඉංග්‍රීසි | Appreciation of Literature - Into the Wild | I | - | - | √ |

7.2 මේ අනුව හඳුන්වා දෙනු ලබන වැඩිදුර අධ්‍යයන විෂය සංඛ්‍යාව 7 කි. මව්බස (දෙමළ/ සිංහල) හා ඉංග්‍රීසි විෂයයන්ට අදාළ ව මෙම වැඩිදුර අධ්‍යයන මොඩියුල ද I වන වාරය තුළ සිසුන්ට අධ්‍යයනය සඳහා අවස්ථාව හිමි වේ.

8. අධ්‍යයන කාර්ය මණ්ඩලය උපයෝජනය කිරීම

8.1 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට සමගාමී ව පාසලක සිටිය යුතු අධ්‍යයන කාර්ය මණ්ඩලය උපයෝජනය කිරීම පහත සඳහන් උපදෙස් ප්‍රකාර ව සිදු කළ යුතු ය.

8.2 විෂයමාලාව පාසල්වල ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි, දැනට බලාත්මක 06/2021 සහ 06/2021(i) චක්‍රලේඛ අනුව අනුමත ගුරු කාර්ය මණ්ඩලය උපයෝජනය කර ගැනීමට පහත පරිදි කටයුතු කළ යුතු අතර 06/2021 සහ 06/2021(i) චක්‍රලේඛවල අනෙකුත් විධි විධාන සහ උපදෙස් ඒ අයුරින් ම තවදුරටත් බලපැවැත්වේ.

8.3 අධීක්ෂක ගුරුවරුන් (06/2021 චක්‍රලේඛයෙ හි අංක 9.2 සහ 9.3 පහත වගන්තිය පරිදි සංශෝධනය කෙරේ )

- අධීක්ෂක ගුරුවරුන් අවම වශයෙන් සතියකට කාල පරිච්ඡේද 14ක් ඉගැන්වීමේ කාර්යයෙහි ද නිරත විය යුතු ය.

8.4 ඉගැන්වීමේ නිරත විය යුතු අවම කාලය (06/2021 චක්‍රලේඛයෙ හි අංක 10.1 පහත පරිදි සංශෝධනය කෙරේ.)

- ගුරුවරයකු සතියකට සේවය කළ යුතු මුළු කාලච්ඡේද සංඛ්‍යාව 35කි. එයින් කාර්යබද්ධ නිදහස් කිරීම්වල දී හැර ගුරුවරයකු අවම වශයෙන් සතියකට කාලච්ඡේද 28ක් විෂයානුබද්ධ ව ඉගෙනුම්ඉගැන්වීම් ක්‍රියාවලියෙහි නිරත විය යුතු ය.

8.5 සහකාර විදුහල්පතිවරුන් (06/2021 චක්‍රලේඛයෙහි අංක 11 පහත පරිදි සංශෝධනය කෙරේ.)

- සහකාර විදුහල්පතිවරුන් සතියකට කාලච්ඡේද 10ක් අවම වශයෙන් ඉගැන්වීම් ක්‍රියාවලියෙ හි නිරත විය යුතු ය.

8.6 නියෝජ්‍ය විදුහල්පතිවරුන් (06/2021 චක්‍රලේඛයෙ හි අංක 12 පහත පරිදි සංශෝධනය කෙරේ)

- නියෝජ්‍ය විදුහල්පතිවරුන් සතියකට කාලච්ඡේද 08ක් අවම වශයෙන් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි නිරත විය යුතු ය.

මෙම සමස්ත උපදෙස් සංග්‍රහයේ සඳහන් සංශෝධන හැර, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම සම්බන්ධ ව මෙතෙක් නිකුත් කර ඇති අනෙකුත් සියලු උපදෙස් සහ චක්‍රලේඛ 2026 වර්ෂයට අදාළ ව එලෙස ම ක්‍රියාත්මක වන බව වැඩිදුරටත් දන්වමි.

නාලක කලුවැව
ලේකම්

පිටපත් :

1. සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
2. සියලු ම පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්
3. සභාපති , ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
4. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
5. විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
6. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව